# මාධ්‍ය නිවේදනය

**ජාතික ගිණුම් ඇස්තමේන්තු; 2021 වර්ෂයේ තෙවන කාර්තුව**

**2021 වර්ෂයේ තෙවන කාර්තුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 1.5 කින් සංකෝචනයවී ඇත.**


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය**

දු.ක: 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


……………………………………………………………………………………………………..

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 තෙවන කාර්තුව (ජුලි 1 සිට සැප්තැම්බර් 30) සඳහා නිෂ්පාදන ප්‍රවේශය යටතේ පවත්නා මිල සහ ස්ථාවර මිල (2010) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

2021 අප්‍රේල් මස අගභාගයේ දී ආරම්භ වූ කොවිඩ් -19 වසංගතයේ තුන්වන රැල්ල ක්‍රමයෙන් තීව්‍ර වෙමින් තෙවන කාර්තුවේ අගෝස්තු මාසය වනවිට උපරිම මට්ටමකට ළඟාවෙමින් පැවතිණි. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම කොවිඩ් -19 ආසාදිත රෝගීන් සංඛ්‍යාවේ ඉහළ වර්ධනයක් වාර්තාවෙමින් කොවිඩ් 19 වසංගතයේ තුන්වන රැල්ලේ බලපෑම ඉහළ ගියේය. නව ඩෙල්ටා ප්‍රභේදය ව්‍යාප්තියත් සමග ආසාධිත රෝගීන් රෝහල් ධාරිතාව ද ඉක්මවා වාර්තා වූ අතර මරණ සංඛ්‍යාව ද ඉහළ ගියේය. මෙම තත්වය නිසා නව සාමාන්‍යකරණයට පත්වෙමින් පැවති ආර්ථික ක්‍රියාකාරකම්වලට නැවත බලපෑම් එල්ල විය. දිවයින පුරා වසංගත තත්වය වැඩිවන විට මෙම තත්වයන් සලකා බලා රජය විසින් කොවිඩ් වසංගතය පැතිරීම පාලනය කිරීමේ අරමුණින් 2021 අගෝස්තු මස 20 දින රාත්‍රියේ සිට දිවයිනම ආවරණය වන පරිදි නිරෝධායන ඇඳිරි නීතිය පනවන ලදී. මෙම නිරෝධායන ඇඳිරි නීතිය වරින් වර දිගු කරමින් ඔක්තෝබර් මස 01 දක්වා පුරා දි 41 ක කාල සීමාවක් ක්‍රියාත්මක විය.

අත්‍යාවශ්‍ය භාණ්ඩ සැපයුම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම, විදේශ විනිමය ගලා ඒම ආරක්ෂා කිරීම, දෛනික ආදායම් උපයන්නන්ගේ ආදායම සහතික කිරීමේ අරමුණු ඇතිව, නිරෝධායන ඇඳිරි නීති කාල සීමාව තුළ ද කෘෂිකර්මාන්ත ආශ්‍රිත කටයුතු, බොහෝ නිෂ්පාදන කර්මාන්ත කටයුතු, ඉදිකිරීම් කටයුතු සහ තෝරාගත් සමහර සේවා ආශ්‍රිත කටයුතු සඳහා සිය කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාමට රජය අවසර දෙන ලදී. එසේ වුව ද කොවිඩ් -19 වසංගත තත්වය මෙම ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ද බලපෑම් එල්ල කළේය. වසංගතයේ අවදානම් තත්වය හමුවේ බහුතරයක් ජනතාව ස්වයං සංවරණ සීමා පනවා ගනිමින් කටයුතු කිරීම නිරීක්ෂණය කළ හැකි විය. මෙම කාල සීමාව තුළ දී විශේෂයෙන් නිෂ්පාදන කර්මාන්ත කටයුතු හා ඉදිකිරීම් කර්මාන්තය කෙරෙහි ද සේවා අංශයේ මගී ප්‍රවාහනය, නවාතැන් පහසුකම් සැපයීම හා පෞද්ගලික සේවා යන ආර්ථික කටයුතු කෙරෙහි ද දැඩිව බලපෑම් එල්ලවිය. එමෙන්ම රට තුළ පැවති

විදේශ විනිමය ගැටළුව නිසා ආනයන සීමා කිරීම් මගින් ඇතිවූ යෙදවුම් මිල ඉහල යෑම ද ආර්ථික ක්‍රියාකාරකම් පසුගාමී වීම කෙරෙහි බලපෑවේ ය. ඉහත හේතූන්වල ප්‍රතිඵලයක් ලෙස බොහෝ ආර්ථික හා ව්‍යාපාරික කටයුතු වල 2020 තෙවන කාර්තුව හා සසඳන විට 2021 තෙවන කාර්තුවේ දී පසුබෑමක් දක්නට ලැබුණි.

2020 වර්ෂයේ තෙවන කාර්තුව දෙස බැලීමේ දී කොවිඩ් -19 වසංගතයේ පළමු රැල්ල මනා පාලනයෙන් පසු ව්‍යාපාරික ක්‍රියාකාරකම් නව සාමාන්‍යකරණය වීමත් සමග ජනතාවගේ එදිනෙදා ජීවන රටාවන් යථා තත්වයට පත්විය. ඒ හේතුවෙන් සිදුවූ වාසිදායක තත්වය නිසා බොහෝ ආර්ථික ක්‍රියාකාරම්වලට සිදුවූ සුභවාදී බලපෑම මත 2020 තෙවන කාර්තුවේ දී රටේ ආර්ථිකය සියයට 1.3 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කිරීමට සමත්විය. ඒ අනුව, 2021 වසරේ තෙවන කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ගණනය කරනු ලබන්නේ 2020 වසරේ තෙවන කාර්තුවේ එසේ ඉහළ ගිය මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පදනම් කරගෙන ය.

2021 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අනාවරණය කරන්නේ, 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 1.5 ක ඍණාත්මක වර්ධන වේගයක් ලෙස ඇස්තමේන්තු කර ඇති බව යි.

තවද, 2021 තෙවන කාර්තුව සඳහා ස්ථාවර මිල ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 2,497,489 දක්වා පහළ ගොස් ඇති අතර එය 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ රුපියල් මිලියන 2,536,490 ක් ලෙස වාර්තා වී තිබුණි.

ඊට අමතරව 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශිය නිෂ්පාදිතය රුපියල් මිලියන 4,132,955 ක් දක්වා සියයට 1.1 කින් ඉහළ ගොස් ඇති අතර එය 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ දී පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 4,087,148 ක් ලෙස වාර්තා වී තිබුණි.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක ත්‍රිත්වය වන “කෘෂිකර්ම”, “කර්මාන්ත”, සහ “සේවා” පවත්නා මිල යටතේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 8.7 ක් , සියයට 29.9 ක් සහ සියයට 57.4 ක් වන අතර “භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩු කළ බදු” සංරචකය 2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයට සියයට 4.1 ක දායකත්වයක් ලබා දී ඇත.

2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සමස්ත කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 1.7ක සුළු ධන වර්ධනයක් වාර්තාකර ඇත. ඒ සඳහා සංචරණ සීමාවන් පැන වූ කාල සීමාව තුළ දී පවා රට පුරා කෘෂිකාර්මික ආර්ථික කටයුතු නොකඩවා කරගෙන යාමට රජය විසින් අවසර ලබා දී තිබීම ධනාත්මකව බලපා ඇත. මෙම කාර්තුවේදී කර්මාන්ත සහ සේවා යන ආර්ථික ක්‍රියාකාරකම් පිළිවෙලින් සියයට 2.1ක හා සියයට 1.6 ක ඍණාත්මක වර්ධන වේගයන් වාර්තා කර ඇත. පසුගිය වසරේ තෙවන කාර්තුවේ දී මෙම ක්‍රියාකාරකම් වල ධන වර්ධන වේගයන් වාර්තා වී තිබුණි.

**කෘෂිකර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන්**

2021 වර්ෂයේ තෙවන කාර්තුවේ දී සමස්තයක් ලෙස කෘෂිකාර්මික ආර්ථික කටයුතු, 2020 වර්ෂයේ තෙවන කාර්තුවේ වාර්තා වූ සියයට 3.1 ක ධනාත්මක වර්ධනය හා සසඳන විට සියයට 1.7 ක මන්දගාමී වර්ධනයක්

වාර්තා කර ඇත. කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල මෙම සුළු වර්ධනය කෙරෙහි විශේෂයෙන්, 'ධාන්‍ය වගා කිරීම' (සියයට 38.0), පැළ බෝකිරීම හා කෘෂිකාර්මික සහය සේවා කටයුතු (සියයට 13.6), 'සත්ව නිෂ්පාදනය'(සියයට 8.9), 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 8.8), 'වන වගා සහ දැව' (සියයට 7.9) 'පළතුරු වගා කිරීම' (සියයට 6.4), 'කුළු බඩු වගා කිරීම' (සියයට 3.6) හා 'තේ වගා කිරීම' (සියයට 2.8) ලෙස සිදුවී ඇති වර්ධනයන් ඉවහල්වී ඇත.

කෙසේ වෙතත්, මෙම කාර්තුව තුළ 'කරදිය ධීවර කටයුතු' (සියයට 10.0), 'එළවළු වගා කිරීම' (සියයට 9.8) 'රබර් වගා කිරීම' (සියයට 8.1), 'මිරිදිය ධීවර කටයුතු' (සියයට 5.2) ලෙස සැලකිය යුතු අයුරින් පසුබෑමට ලක්වී ඇති අතර 'වී වගා කිරීම' (සියයට 1.0) සුළු පසුබැසීමක් වාර්තා කර ඇත.

**කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන්**

2021 වසරේ තෙවන කාර්තුවේ දී සමස්ත කාර්මාන්ත ආර්ථික කටයුතු සියයට 2.1 ක පසුබෑමක් වාර්තා කර තිබේ. නිෂ්පාදන කර්මාන්ත කටයුතු කීපයක මෙන්ම ඉදිකිරීම් කර්මාන්තයේ හා පතල් හා කැණීම් කටයුතුවල සිදු වූ සංකෝචනයන් මෙම සෘණාත්මක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබේ.

පෙර වසරේ තෙවන කාර්තුවට සාපේක්ෂව 2021 වසරේ තෙවන කාර්තුව තුළ සමස්ත නිෂ්පාදන කර්මාන්තය සියයට 0.6 කින් පසු බැසීමට ලක්වී ඇත. එහිදී නිෂ්පාදන කාර්මාන්ත තුළ දළ දේශීය නිෂ්පාදිතයට වැඩිම දායකත්වයක් සපයන (සියයට 6.8 පමණ) 'ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය' 2021 වසරේ තෙවන කාර්තුවේ දී සියයට 2.8 කින් පසුබෑමට ලක්වීම සමස්ත නිෂ්පාදන කර්මාන්ත අංශය තුළ සිදුවූ සංකෝචනයට ප්‍රධාන වශනේ බලපා ඇත. එමෙන්ම 'ගෘහ භාණ්ඩ නිෂ්පාදනය' (සියයට 20.4), 'මූලික ලෝහ වර්ග නිෂ්පාදනය සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය' (සියයට 10.9), 'රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන' (සියයට 6.3), 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනය' (සියයට 6.2), 'වෙනත් නිෂ්පාදන කර්මාන්ත' (සියයට 1.4) යන ආර්ථික කටයුතුවල සිදු වූ සංකෝචනයන් ද මේ සඳහා බලපා ඇත.

කෙසේ වෙතත්, 2021 තෙවන කාර්තුව තුළ 'දැව හා දැවමය නිෂ්පාදන' (සියයට 8.9), 'රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන' (සියයට 7.6), 'කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදන' (සියයට 7.1), 'යන්ත්‍ර සහ උපකරණ නිෂ්පාදන' (සියයට 6.7) 'රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන' (සියයට 4.9) ලෙස ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

සමස්ත කර්මාන්ත අංශය සඳහා සියයට 6.7 ක දායකත්වයක් සපයන 'ඉදිකිරීම් කර්මාන්තය' සැලකිය යුතු ලෙස සියයට 6.0 ක පසු බැසීමක් මෙම කාර්තුව තුළ දී වාර්තා කර ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වූ මෙම පසු බැසීමත් සමඟ 'පතල් හා කැනීම්' කර්මාන්තය ද මෙම කාර්තුව තුළ සියයට 6.9 ක සෘණ වර්ධන වේගයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, 2021 තෙවන කාර්තුවේදී 'විදුලි ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම' (සියයට 1.8) හා 'ජලය එක් රැස් කිරීම, පිරිපහදු කිරීම සහ බෙදා හැරීම' (සියයට 7.3) ලෙස වර්ධනය වී ඇත.

**සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන්**

2021 වසරේ තෙවන කාර්තුව තුළ සමස්ත සේවා අංශයේ වර්ධනය ද සියයට 1.6 කින් පහත වැටී ඇත. සේවා අංශයේ මෙම පසු බැසීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 9.5

බැගින් සම දායකත්වයක් දක්වන ‘ප්‍රවාහනය', 'අනෙකුත් පෞද්ගලික සේවා' යන ආර්ථික කටයුතුවල සිදුවූ පසුබැසීමයි. මෙම ආර්ථික කටයුතු පිළිවෙලින් සියයට 14.9 කින් හා සියයට 5.7 කින් මෙම කාර්තුවේදී පහත වැටී ඇත. කොවිඩ් -19 වසංගත තත්වය නිසා පැනවූ දිගුකාලීන නිරෝධායන ඇඳිරි නීතිය හා සෞඛ්‍ය මාර්ගෝපදේශ මෙම ආර්ථික කටයුතුවල සිදුවූ පසුබෑම කෙරෙහි බලපා ඇති බව නිරීක්ෂණය කළ හැකිය. තවද මෙම කාර්තුවේදී ‘නවාතැන් හා ආහාර පාන සැපයීම’ (සියයට 19.9), 'වෘත්තීය සේවා' (සියයට 0.9) ලෙස පසුබැසීම් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, 2021 වසරේ තෙවන කාර්තුව තුළදී 'විදුලි සංදේශ සේවා' (සියයට 18.9), 'තොරතුරු තාක්ෂණ සේවා' (සියයට 16.1), 'මූල්‍ය සේවා' (සියයට 12.9), 'සෞඛ්‍ය සේවා' (සියයට 12.3), යන ආර්ථික කටයුතු 2020 තෙවන කාර්තුව හා සසඳන විට කැපී පෙනෙන ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන පරිදි, 2021 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු පිළිබඳ විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/GDP



පී.එම්.පී. අනුර කුමාර

අධ්‍යක්ෂ ජනරාල්